ගෙවත්තේ පුංචි දඟයා

ආර්.කේ.ජී.අයි. උදේශ්
බණ්ඩාර

ගෙවත්තේ පුංචි දඟයා

ආර්.කේ.ජී.අයි. උදේශ් බණ්ඩාර

කතා

පළමු දිගහැරීම

රණබිම රාජකීය විද්‍යාලය මහනුවර

6-D ශ්‍රේණිය

2025.02.08

පිදුම

මෙම පොත නිර්මාණයේදී උදව් කළ

සාගරිකා ගුරුමෑණියන්ටද,

මාගේ දෙමව්පියන්ට ද,

සහෝදරියන්ටද,

පරිසරයට ආදරය කරන සියලු දෙනාට ද

මෙම පොත බැතිබරව පිළිගන්වමි.

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහමායා බාලිකා විද්‍යාලයෙ - මහනුවර

පටුන

	පිටු අංකය
1. හැඳින්වීම	1
2. ක්‍රමවේදය	2
3. නිරීක්ෂණය	3
4. වේයාගේ ජීවන චක්‍රය	16
5. නිගමනය	17
6. ලබාගත් දැනුම සහ අත්දැකීම්	17
7. මුහුණ දුන් ගැටලු හා නිරීක්ෂණය කිරීමට යොදාගත් උපක්‍රම	18
8. පරිසර අධ්‍යයන ආශ්‍රිත මාගේ අනාගත සැලසුම්	18
9. පරිසරය සුරැකීමට මගේ දායකත්වය	19

1.හැඳින්වීම

මාගේ තාත්තාගෙන් නිතර දෙවේලේ බැනුම් අහන පුංචි දඟකාරයෙක් ඉන්නවා. ඒ තමා වේයා. හැම වෙලාවේම කරදරයක් කියල බැනුම් අහන මේ පුංචි දඟකාරයා ගැන විස්තර හොයාගන්න මට පුංචි ආසාවක් ඇතිවුණා. මම ඉන්නෙ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ කියන ප්‍රදේශයේය. ඉතිං අපේ පැත්තේ මේ පුංචි සතා නොදකින තැනක් නැති තරම්. තාත්තාට හිතුනාට වේයා කියන්නේ කරදරයක් කියලා මට නම් හිතෙන්නේ වේයා කියන්නේ හොඳ වැඩකාරයෙක් කියලා.

මොකද වේයාගේ කදිම නිර්මාණයක් තමයි හුඹස. අනිත් අයට නම් ඒක නිකංම මැටි ගොඩක් වගේ පෙනුනට මටනම් හිතුනෙ වේයා කියන්නේ ඉංජිනේරුවෙක් වගේ කියලා. හුඹසක් ඇතුලේ හරියට අපේ ගෙයක් වගේමයි. මෙලෙසම අප පරිසරයේ ලොකු වැඩ කරන පුංචි වැඩකාරයන් ගොඩට මීමැස්සන්, කුහුඹුවන්, බඹරු, දෙබරු ආදීන්ද ඇතුළත් කළ හැකිය.

මා මේ අතරින් නිරීක්ෂණය කිරීමට තෝරාගත් වේයා මිනිසුන්ට කරදරයක් වුණාට පරිසරයට ලොකු උදව්වක් කරන සතෙක්. පරිසරයේ තියෙන ඕන නැති දේවල් දිරාපත් කරලා දාන්න මෙයාට පුළුවන්.

ඉතින් වේයා කියන්නෙම මිනිස්සුන්ට වැඩක් නැති උනාට සොබා දහමේ ඉන්න පුංචි දඟකාර වැඩ්ඩෙක්.

2.ක්‍රමවේදය

- ගෙවත්තේ තිබූ අලුත කපන ලද දර ගොඩක් නිරීක්ෂණය කිරීම.
- නිරීක්ෂණය සඳහා සවස් කාලය වෙන්කර ගැනීම.
- සති හයක් තිස්සේ දිනපතා දර ගොඩ නිරීක්ෂණය කිරීම.

යොදාගත් උපකරණ;

- අත් කාචය - ලොකු කර බැලීමට
- අඩි රූල - දිග මැනීමට
- විදුලි පන්දම - අඳුරු අවස්ථා වලදී එළිය ලබා ගැනීමට
- පොත්, පත්තර - තොරතුරු සොයා ගැනීමට

තොරතුරු සොයාගත් ආකාර;

- ගුරුවරියගෙන්
- අන්තර්ජාලයෙන්
- පොත්පත්වලින්
- අත්තම්මලාගෙන්

3.නිරීක්ෂණය

❖ **දිනය - 2023.07.17** **කාලය - පස්වරු 5.00**

ස්ථානය - ගෙවත්ත **කාලගුණය - තරමක් අඳුරුයි.**

අලුත කපන ලද ගෙවත්තේ තිබූ දර කැබලි නිරීක්ෂණය කිරීම. මෙදින දර ප්‍රාණවත්ත ඇති බව දක්නට ලැබුණි.



❖ **දිනය - 2023.07.18** **කාලය - පස්වරු 5.30**

ස්ථානය - ගෙවත්ත **කාලගුණය - වියලි කාලගුණයක්**

මෙදිනද ද සවස මා දරගොඩ බැලීමට ගියෙමි. නමුත් මා එහි වෙනසක් දුටුවේ නැත.

ස්ථානය - **ගෙවත්ත**			
දිනය	**වේලාව**	**නිරීක්ෂණය**	**කාලගුණය**
2023.07.19	පස්වරු 4.00	මෙදින මම දර බැලීමට ගියෙමි. එතරම් වෙනසක් නැත. පෙර දිනට වඩා වියලි බවක් දුටුවෙමි.	වියලි කාලගුණයක්
2023.07.20	පස්වරු 5.00	සුපුරුදු පරිදි දරගොඩ බැලීමට ගියෙමි. පොතු වියළී ඉරිතලා තිබුණි. කුහුඹුවන් වැනි කුඩා සතුන් ඒ මත දක්නට ලැබුණි.	මීදුම ගතියක් දක්නට ලැබුණි.
2023.07.21	පස්වරු 5.30	පිපුරුණු පොතු සහිත දර තෙත ගතියකින් දක්නට ලැබුණි.	වැසි පොදක් වැටුණ තෙත කාලගුණයක්
2023.07.22	පස්වරු 5.30	සෙනසුරාදා නිසා සෙල්ලම් කළ මා හට දරගොඩ බැලීමට මතක් වූයේ තරමක් හවස් වූ පසුවය. එදින අපූරු දෙයක් දුටුවෙමි. දර ගොඩේ යට ලී දඬුවල පස් බැඳී තිබුණි. සවස් වූ නිසා මම දර ගොඩ වටේට බලා නිවසට ගියෙමි	වියලි කාලගුණයක්



- **දිනය - 2023.07.23** **කාලය - පස්වරු 2.00**

ස්ථානය - ගෙවත්ත **කාලගුණය - හිරු එළිය වැටී තිබුණි.**

දහම් පාසල් ගොස් ගෙදර පැමිණි මා අත් කාචයද රැගෙන ලී කැබලි බැලීමට ගියෙමි. පස් තවදුරටත් උඩට බැඳී තිබුණි. මම අත්කාචයෙන් ඒවා බලන විට වේයන් කලබලයෙන් එහෙ මෙහෙ දුවමින් වැඩ කරන ආකාරයත් ලී කැබැල්ලෙහි පේලියට සිට හාරන ආකාරයක් මම දුටුවෙමි. තවද මෙහිදී සුදු පාට වේයන්ද දුඹුරු හිස් ඇති වේයන්ද දැකගත හැකි විය. වේයන් නිරීක්ෂණය කරමින් දිගටම සිදුවන දේ බැලීමට මාගේ සිත තුළ ඇති ආශාව තවත් වැඩි විය.

භාවිත කළ උපකරණය - අත් කාචය

- **දිනය - 2023.07.24** **කාලය - පස්වරු 7.00**

  ස්ථානය - ගෙවත්ත **කාලගුණය - කළුවරයි**

අඳුරු වැටුණු විට වේයන්ගේ ක්‍රියාකාරකම් බැලීමට මම විදුලි පන්දමද රැගෙන ගියෙමි. වේයෝ දවල් මෙන්ම රෑද කලබලකාරී ලෙස වැඩ කරමින් සිටියහ. මට පුදුම හිතුණි. මා සිතුවේ ඔවුන් දවල් වැඩ කර රෑ විවේක ගනු ඇතැයි කියාය.

භාවිත කළ උපකරණය - විදුලි පන්දම



- **දිනය - 2023.07.25** **කාලය - පෙරවරු 9.00**

  ස්ථානය - පාසල **කාලගුණය - හිරු පායා තිබුණි**

ගුරුතුමිය හමුවූ මම මේ පිළිබඳව සාකච්ඡා කළෙමි. ඇය මට වේයන් පිළිබඳ තොරතුරු ලබා දුන්නාය. ඉන්පසු මමද ඒ පිළිබඳ තොරතුරු සෙව්වෙමි. මම පුස්තකාලයට ගොස් වේයන් පිළිබඳ පොතක් ද සොයාගත්තෙමි. පාසල ඇරී ගෙදර ගිය මම පරණ පත්තර එකතුව අවුස්සා වේයන් පිළිබඳ ලිපි කිහිපයක් සොයා ගත්තෙමි. මේ සියලු දේවල් වලින් මට තොරතුරු ගොඩක් ලැබුණි.

වේයාගේ තොරතුරු

- ශ්‍රී ලංකාවේ භාවිතා වන නම - වේයා
- ඉංග්‍රීසි නම - Termite
- ද්‍රවිඩ නම - கரையான் (කරෙයියාන්)
- විද්‍යාත්මක නම - **<u>Isoptera</u>**
- වේයාගේ උපරිම ප්‍රමාණය - 6mm

  භාවිත කළ උපකරණය - අඩි රූල

වේයාගේ කොටස්



ස්ථානය - ගෙවත්ත			
දිනය	**වේලාව**	**නිරීක්ෂණය**	**කාලගුණය**
2023.07.26	පස්වරු 5.00	පස් ගොඩ තවත් ඉහළට බැද තිබූ බව මම දුටුවෙමි.	වියලි කාලගුණයක්
2023.07.27	පස්වරු 4.00	පස් තව තවත් ඉහලට බැද තිබූ අතර ලී කැබලි ගොඩේ උස ක්‍රමයෙන් අඩු වන බවත් දක්නට ලැබුණි.	වියලි කාලගුණයක්
2023.07.28	පස්වරු 5.30	පස් තවදුරටත් ඉහළට බැඳ තිබුණි.	අඳුරු වළාකුළු සහිත කාලගුණයක්.
2023.07.29	පස්වරු 5.45	ලී ගොඩේ උස තවත් අඩු වී ඇති ආකාරය දක්නට ලැබුණි.	අඳුරු කාලගුණයක්.
2023.07.30	පස්වරු 5.30	ලී දඬු දුඹුරු පාට වී තිබුණි. අද දින රැහැයි හඬ ද මට ඇසුණි.	අඳුරු කාලගුණයක්.
2023.07.31	පස්වරු 5.00	ලී කැබලි වටේ පස්ගොඩ තවත් වැඩි වී තිබුණි.	හිරු බැස යන උණුසුම් කාලගුණයක්.
2023.08.01	පස්වරු 5.00	ලී කැබලි දුඹුරු පාට වී තිබීම. ලී කැබලි ගෙවී ඇති බවක් දක්නට ලැබුණි.	මදක් අඳුරු කාලගුණයක්.
2023.08.02	පස්වරු 5.40	පස් ප්‍රමාණය වැඩි වී ඇති බවක් දක්නට ලැබුණි. පස් තෙත ගතියකින් දක්නට ලැබුණි.	වියළි සුළං සහිත කාලගුණයක්.

දිනය	වේලාව	නිරීක්ෂණය	කාලගුණය
2023.08.03	පස්වරු 5.20	ලී ගොඩේ උස තවත් අඩුවී තිබුණි.	වියලි කාලගුණයක්.
2023.08.04	පස්වරු 4.50	පෙර දින සේම දක්නට ලැබුණි.	මඳක් අඳුරු කාලගුණයක්.
2023.08.05	පස්වරු 5.00	ලී ගොඩ වටේ පස් ක්‍රමයෙන් වැඩි විය.	මඳක් අඳුරු කාලගුණයක්.
2023.08.06	පස්වරු 5.00	එතරම් වෙනසක් දක්නට නොලැබුණි.	වියලි කාලගුණයක්.
2023.08.07	පස්වරු 5.15	ලී කැබලි වැසීමට තරම් පස් ඉහළ ගොස් ඇති බව දක්නට ලැබුණි.	වියලි කාලගුණයක්.
2023.08.08	පස්වරු 5.45	දැන් ලී ගොඩේ උස අඩුවී ඇත.	අඳුරු කාලගුණයක්.
2023.08.09	පස්වරු 6.00	එතරම් වෙනසක් දක්නට නොලැබිණි.	අඳුරු කාලගුණයක්.
2023.08.10	පස්වරු 4.30	පස්ගොඩ විශාල වෙමින් පවතී.	වියලි කාලගුණයක්.
2023.08.11	පස්වරු 4.35	පෙර දින සේම තිබුණි. වෙනසක් නොපෙනුණි.	මඳක් වියලි කාලගුණයක්
2023.08.12	පස්වරු 4.55	පස් වල කොළ කැබලිද ඇලී තිබුණි.	මඳක් වියලි කාලගුණයක්.
2023.08.13	පස්වරු 5.10	එතරම් වෙනසක් වී නොතිබුණි.	වියලි කාලගුණයක්.
2023.08.14	පස්වරු 5.45	එතරම් වෙනසක් වී නොතිබුණි	අඳුරු කාලගුණයක්.

2023.08.15	පස්වරු 8.15	මෙදින ලී කැබලි වල උස තවත් අඩුවී තිබුණි. කණාමැදිරියෝ පියාඹන ආකාරයද මම දුටුවෙමි.	අඳුරු කාලගුණයක්
2023.08.16	පස්වරු 4.00	උඩ ලී කැබලි දෙක තුනක් ඇරෙන්නට ඉතුරු ලී කැබලි දිරාපත් වී කැබැලි වලට කැඩී ඇත.	ඉර බැස යන විට ඇති දීප්තිමත් කාලගුණයක්.
2023.08.17	පස්වරු 5.30	ඇතැම් ලී කැබලි වල මැද පස් පිරී තිබුණි.	අඳුරු කාලගුණයක්.
2023.08.18	පස්වරු 5.45	පස්ගොඩ තවදුරටත් වැඩි වී තිබුණි.	අඳුරු කාලගුණයක්.

❖ **දිනය - 2023.08.19** **කාලය - පෙරවරු 9.00**

ස්ථානය - ගෙවත්ත **කාලගුණය -** දීප්තිමත් කාලගුණයක්

එදින පාසල් නිවාඩු දිනයක් නිසා උදේ නමයට පමණ ගෙවත්තට ගොස් බැලුවෙමි. ලී කැබලි වල මැද පස් පිරී තිබූ අතර සමහර ලී කැබැලි වල කානු වගේ හැරි ඇති බව මට පෙනුණි. අත්කාචයෙන් බැලූ විට ඒවායේ මැද වේයන් පිරී හරි හරියට වැඩවල යෙදී ඇති බව දැක වේයන් පිළිබඳ සෙවීමට ඇති මගේ ආශාව තවත් වැඩි විය.

භාවිත කළ උපකරණ - අත් කාචය



❖ **දිනය - 2023.08.20** **කාලය - පෙරවරු 8.00**

ස්ථානය - ගෙවත්ත **කාලගුණය -** මඳක් සීතලයි.

දිගට තිබුණු ලී කැබලි කුඩා කැලි වලට වෙන් වී තිබුණි. හිරු එළිය වැටෙන උදේ නිසාදෝ වේයන් වෙනදා හවසට වඩා ඉක්මනින් වැඩ කරන ගතියක් මම දුටුවෙමි. ඒ අසල පස් ගොඩේ ගැවි ගැවි තිබූ තණකොළ වේයෝ කපන ආකාරය හරිම අපූරුයි. එයාලා ඒවා කෑමට ගන්නවා ඇති කියා මම සිතුවෙමි.

දිනය	වේලාව	නිරීක්ෂණය	කාලගුණය
2023.08.21	පෙරවරු 9.00	ලී කැබලි සෑහෙන දුරට පස් වී අවසන්ව ඇත.	හිරු එළිය වැටුණු කාලගුණයක්.
2023.08.22	පෙරවරු 10.00	මැද ලී කැබලි නැතිවී ගොස් ඇත.	දීප්තිමත් කාලගුණයක්.
2023.08.23	පෙරවරු 9.00	ලී කැබලි තවත් දිරාපත්ව ඇත.	මඳක් සීතලයි.
2023.08.24	පෙරවරු 9.00	මෙදින මම අත්කාවය ද රැගෙන ගියෙමි. වේයන් හරි හරියට වැඩ කරන ආකාරය මම දුටුවෙමි. එලෙසම විවිධ ප්‍රමාණවල වේයන් මම දුටුවෙමි. නිවෙසට පැමිණි මම, මව සමඟ මේ පිළිබඳව සාකච්ඡා කළෙමි. මව කියා සිටියේ එහි නායකයෙක්, වැඩිහිටි අය, තරුණ අය, පැටව් ආදී විවිධ වර්ගයේ වේයන් සිටිනු ඇතැයි කියාය.	ඉර පායා ඇති දීප්තිමත් කාලගුණයක්

❖ **දිනය - 2023.08.25** **කාලය - පෙරවරු 9.45**

ස්ථානය - නිවස **කාලගුණය -** දීප්තිමත්.

මෙදින මට වේයන් පිළිබඳ වැඩි විස්තර සොයා ගැනීමට සිතුණි. එම නිසා මම නිවසේ තිබූ විද්‍යා පුවත්පත් එකතුව අවුස්සා බැලූවෙමි. එහි තිබී මට වේයන් පිළිබඳ ලිපි කිහිපයක් ද ලැබුණි. ඒ අනුව වේයන් ජනපදයක් ලෙස ජීවත් වන බවත් එහි

- රැජිණ
- රජතුමා
- ආරක්ෂක භටයින්
- කම්කරු,

වශයෙන් සිටින බවත් මම ඒ තුළින් දැන ගතිමි. මොවුන් වැඩ බෙදාගෙන කරමින් සමගියෙන් ජීවත් වනු ඇතැයි මට සිතුණි.



මෙරුවා

- **දිනය - 2023.08.26** **කාලය -** පස්වරු 6.30

ස්ථානය - ගෙවත්ත. **කාලගුණය -** අඳුරුයි.

මම මෙදිනෙද සුපුරුදු පරිදි යෑමට සැරසී දොර අරින විටම නිවසේ ඉදිරිපස විදුලි බුබුළ වැහෙන්න තරම් තටු සහිත කුඩා සතුන් ජාතියක් පියාඹන ආකාරය මම දුටුවෙමි. මම දුවගෙන ගොස් වේගුල බැලුවමි. පුදුමයකි! එයින් මතුවූ වේයන් වෙනදා මෙන් නොව ඔවුන්ට තටු ඇවිත් තිබුණි. මම නැවත නිවසට ගොස් විදුලි පන්දම රැගෙන නැවතත් වේ ගුල ලගට ගොස් බැලූවෙමි. ඔව්. මා සිතූ දේ නිවැරදියි. වේයන් වතුර මලකින් වතුර එන්නාක් මෙන් ගුලෙන් පිටතට පියාඹයි.

අයියෝ! පියාඹමින් සිටි වේයන්ගේ තටු ගැලවී බිම වැටෙන්නට විය. මෙය මට දුකක් වුවද ගෙම්බන්ට, හූනන්ට නම් රජ මඟුල් වැනිය. හූනන් බිත්ති දිගේ පැමිණ වේයන් අල්ලා ගෙන කන්නට වූ අතර ගෙම්බන්ද පැන පැනවිත් වේයන් අල්ලාගෙන බඩ පැලෙනතුරු කෑහ. තටු කොතරම්ද කියනවා නම් මල්ලකට පිරවිය හැකි තරම් තටු ගොඩක් බිම වැටී තිබුණි. එලියට පැමිණි සීයා මෙය දැක "හෙටනම් වහිවී" කියා කීවේය. තාත්ත මෙය දැක තටු ගැලවුණු වේයන් මාළු ඇල්ලීමට ඇම ලෙසද භාවිත කරන බව කියා සිටියේය. වේයන්ගේ මේ අවස්ථාව මෙරු ලෙසද හඳුන්වන බව මම අසා දැන ගත්තෙමි.

- **දිනය - 2023.08.27** **කාලය - පෙරවරු 9.00**

ස්ථානය - ගෙවත්ත **කාලගුණය -** දීප්තිමත්.

පෙර දින තටු පැමිණි වේයන් ගැන මම අම්මා සමඟ සාකච්ඡා කළෙමි. මෙය කෘමීන්ගේ ජීවන චක්‍රයේ එක් අවස්ථාවක් ලෙස ඇය ප්‍රකාශ කළාය. "අදනම් බිම්මල් ඇති" කියාගෙන අත්තම්මා නිවසින් එළියට ආවාය. මම අත්තම්මා සමග ගොස් බලන විට දිරාපත් වූ ලී කැබලි කීපයක් උඩ පිච්ච මල් පිපී ඇති ආකාරයට බිම්මල් පිපී තිබුණි. අත්තම්මා මේවාට වේ හතු යැයි කීවාය. අත්තම්මා ඒවා කතුරකින් කැපුවාය. ඇය දහවල් කෑමට රසවත් හතු ව්‍යංජනයක් පිළියෙල කර තිබුණි. මම මේ හතු කෑවෙමි. මේවා ප්‍රෝටීන් අඩංගු ආහාරයක් යැයි ඇත්තම්මා කීවාය.

මම අත්කාවයෙන් වේයන් සිටි තැන නිරීක්ෂණය කළෙමි. එහි විවිධ හැඩැති වේයන් දක්නට ලැබුණි. මම මේ පිළිබඳ වැඩිදුර විස්තර පොත් පත් ආශ්‍රයෙන් සොයාගත්තෙමි.

කම්කරු වේයන්



කම්කරු වේයන් වඳය. තටු රහිතය. ඇස් අන්දය.

- ආහාර ගෙන එයි.
- පැටවුන් රැකබලා ගැනීම
- සොල්දාදුවන් පෝෂණය කරයි

මොවුන්ගේ ආයු කාලය අවුරුදු එකේ සිට දෙක දක්වා වේ. තවද මොවුන් ගෙවල් සෑදීම පිරිසිදු කිරීම සිදුකරයි

ආරක්ෂක හටයින්



ආරක්ෂක හටයින් පියාපත් නැති වඳ අන්ධ සතුන්ය. සොල්දාදුවන්ට තමන්ව පෝෂණය කරගත නොහැකිය. සාමාන්‍යයෙන් සොල්දාදුවන්ගේ ප්‍රමාණය කම්කරුවන්ගේ ප්‍රමාණයට වඩා කුඩාය. සොල්දාදුවන්ට බලවත් හකු ඇත. මොවුන්ගේ ආයු කාලය අවුරුදු එකේ සිට දෙක දක්වා වේ.

3.වේයාගේ ජීවන චක්‍රය



4.නිගමනය

- වේයන් දර ලී දිරාපත් කරයි.
- වේ තුඹසක් තුළ රැජිණ, රජතුමා, කම්කරුවන් හා ආරක්ෂක භටයින් වාසය කරයි.
- වේයාගේ ජීවන චක්‍රයේ අවස්ථා ලෙස බිත්තර, කීටයා, නිම්ෆ්, සේවකයා, සොල්දාදුවා, ප්‍රජනක ලෙසත් පියාපත් සහිත ප්‍රජනක පිරිමි සතා, ප්‍රජනක කටයුතු කරන්නා, රජු, රැජිණ ලෙස දක්වයි.
- වේයන් ඉතා කඩිසරව, එකමුතුව දිවා රාත්‍රී දෙකේම වැඩ කරන සතුන් විශේෂයකි.

5.ලබාගත් දැනුම සහ අත්දැකීම්

- ලී දිරාපත් කර ගොඩගැසෙන මැටි අංශුවලින් නිර්මාණශීලී ගෘහයක් සාදයි. එය තුඹසයි.
- කම්කරු වේයන් මහන්සි වී දිවා රාත්‍රී වැඩ කරයි. සොල්දාදුවන්ට ශක්තිමත් හකු පිහිටා ඇත.
- ජීවන චක්‍රයේ එක් අවස්ථාවක පියාපත් ලැබෙන සතුන් මෙරු ලෙස හඳුන්වයි. මෙරු පරිසරයට එකතු වීමත් සමඟ වැසිබර කාලගුණයක් ඇති වීමත් පසු දින වේ හතු පිපීමත් මගින් පරිසරයේ විවිධ ක්‍රියාකාරකම් අතර බැඳීමක් ඇති බව මම අවබෝධ කර ගත්තෙමි.
- කුඩා සතෙක් වුවත් පරිසරයට විශාල මෙහෙයක් ඉටු කරයි.
- යම් අධ්‍යයනයක් කිරීමට දීර්ඝ කාලයක් අවශ්‍ය බවත්, කැපවීමෙන් හා උවමනාවෙන් කාර්යයේ යෙදිය යුතු බවත් තේරුම් ගත්තෙමි.
- මෙවැනි ක්‍රියාකාරකම්වල යෙදීම, සිත සතුටු කරන විනෝදාංශයක් බව මම තේරුම් ගත්තෙමි.

6.මුහුණ දුන් ගැටලු හා නිරාකරණය කරගැනීමට යොදාගත් උපක්‍රම

- වේයාගේ කොටස් පියවි ඇසට නොපෙනීම - ඒ සඳහා අත්කාචය භාවිතා කිරීම.
- වේයාගේ දිග මැනීමට අපහසු වීම - අක්කාගේ උදව් ඇතිව කොලයක තබා දිග මැන ගැනීම.
- නිරීක්ෂණයට ගෙවත්තට යාමේදී කූඩැල්ලන් කෑම - බූට්ස් සපත්තු පැළඳ ගෙවත්තට යෑම.
- තුඹස ඇතුළත නිරීක්ෂණය කළ නොහැකි වීම - පොතකින් එම තොරතුරු ලබා ගැනීම.

7.පරිසර අධ්‍යයනය ආශ්‍රිත මගේ අනාගත සැලසුම්

- වේයා මෙන්ම ලොකු වැඩ කරන පුංචි සතුන් විශාල වශයෙන් පරිසරයේ ජීවත් වේ. ඔවුන් පිළිබඳ අධ්‍යනය කර දැනුමක් ලබා ගැනීම
- සතුන්ගේ ජීවන රටාවේ පරිසරය, ආර්ථිකයට වාසි වන අවස්ථා සොයාබලා වැඩි දියුණු කිරීම.
- විවිධ සොයාගැනීම්, තොරතුරු, වාර්තා ඉදිරිපත් කරමින් පාසලේ, ළමා සමාජයේ ආදී සංගම්වල ජෛව විවිධත්වය රැක ගැනීමෙන් ලෝකයට වන හිතකර තත්ත්ව ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

8.පරිසරය සුරැකීමට මගේ දායකත්වය

අප අවට ඇති ගංගා, ඇළදොළ, වනාන්තර, ගෙවතු, ජීවීන් සියල්ලගේ එකතුව පරිසරයයි.

අපි මෙන්ම සියලුම සතුන් හා ශාක පරිසරයේ ජීවත් විය යුතුය. සැමටම එකසේ අයිතියක් ඇත. විවිධ නිර්මාණ පරිසරයට එක් වන්නේ විවිධ ජීවීන් නිසාය. කුඩා කල සිටම අපි සතුන්ගේ නිදහස හා අයිතීන් විනාශ නොකිරීමට කටයුතු කරමු.

පාසල් මට්ටමෙන් ආරම්භ කර මුළු ලෝකවාසීන්ටම ජෛව විවිධත්වය රැක ගැනීම පිළිබඳ දැනුම ලබාදීම, නීති රීති පැනවීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මට සිතෙයි. එලෙසම කඳු මුදුන්වල කැලෑ ගිනි තබා ඇති විට මට දැනෙන්නේ විශාල දුකකි. සියලුම ජීවීන් දැවී යන විට මා හට නිරීක්ෂණය කිරීමට ඉතිරි වන්නේ කවුද....? මේ සඳහා කොපමණ නීති රීති තිබුණද අප තුල යහපත් සිතිවිලි ඇති කරගත යුතුය. මේ සඳහා වැඩසටහන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීම මගේ බලාපොරොත්තුවයි. පාසල් දරුවන් වශයෙන් කුඩා කල සිටම පරිසරය සුරැකීමට දායකවීම අපේ යුතුකමකි. පිරිසිදු හුස්මක් රැගෙන දිව්‍ය ලෝකයක් වැනි පරිසරයක් නිර්මාණය කිරීමට සැමවිටම මම නැගී සිටිමි.

- ජාතික විද්‍යා පදනම මගින් පවත්වන ළමා පරිසරවේදියා තරගයේ ප්‍රථම දස දෙනා අතරට තේරුණු මෙම කෘතිය NSF school science Research symposium (NSSRS) – 2024 සඳහාද ඉදිරිපත් කරන ලදී.

- Nature Diary Competition – 2024 තරගයේ ප්‍රථම දස දෙනා අතරට තේරී පත් විය.

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනය ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි.

තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්.

ISBN 978-624-208-765-8